ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2024.09.12

**පැමිණිලිකාර පාර්ශවය** : සුසෙව් හේවාගේ අකිල සඳරුවන් ප්‍රනාන්දු
අංක : 79, බෝසිරිපුර,
කළුතර උතුර. (වින්දිතයා)

**වගඋත්තරකාර පාර්ශවය** : පො. කො. 77017 එල්. ඩබ්. ප්‍රියංකර
පුෂ්පකුමාර මයා
පොලිස් ස්ථානය, කළුතර උතුර

**<u>පැමිණිලි අංකය : HRC/HO/2415/20/I (vi)</u>**

**<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>**

පැමිණිලිකරු විසින් ඉහත පැමිණිලි අංකය යටතේ 2020.11.17 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු ඔහුගේ ඥාතීන් සමග 2020.09.27 වන දින අළුයම 1.00ට පමණ කළුතර වස්කඩුව වාඩියවත්ත ක්‍රීඩාංගනය අසල සිට අංක CAX 2241 දරණ මෝටර් රථයෙන් පැමිණෙමින් සිටියදී ඒ ආසන්නයේ දී කළුතර උතුර පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ ස්ථානාධිපති විසින් තම වාහනය නතර කළ බවයි. අනතුරුව එම ස්ථානයේ සිටි ප්‍රියංකර නැමති පොලිස් නිලධාරියා විසින් තමාට වාහනයෙන් බහින ලෙසත්, රියදුරු අසුනේ දොර විවෘත කර එන්ජිම ක්‍රියාවිරහිත කරන ලෙසත්, තමාට මෝටර් රථයේ පිටුපස අසුනේ හිඳ ගන්නා ලෙසත් නියෝග කළ බවත්, ඉන්පසුව ප්‍රියංකර නැමති පොලිස් නිලධාරියා විසින් පැමිණිලිකරුගේ මෝටර් රථය පදවා ගෙන කළුතර උතුර පොලිස් ස්ථානයට මෝටර් රථයේ සිටි සියලු දෙනා රැගෙන ආ බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, කළුතර උතුර පොලිස් ස්ථානයට පැමිණි පසු පැමිණිලිකරු මෝටර් රථයෙන් පිටතට පැමිණෙන විටම ප්‍රියංකර නැමති පොලිස් නිලධාරියා විසින් පැමිණිලිකරුගේ කමිස කොලරයෙන් තදින් අල්ලා ගත් බවත්, එම අවස්ථාවේදී පැමිණිලිකරුගේ බිරිඳ "ගහන්න එපා"



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

යනුවෙන් කෑ ගැසූ නමුත්, එවිටම පොලිස් නිලධාරින් 4 ක් 5 ක් පමණ බැටන් පොලු වලින්, පිස්ටල් එකකින් හා අතින් පයින් තමාට පහර දුන් බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

අනතුරුව පැමිණිලිකරුගේ අත් දෙකෙන් හා කකුල් දෙකෙන් ඔසවාගෙන ගොස් පොලිස් ස්ථානයේ ඇති සිර මැදිරියකට දැමූ බවත්, එම සිර මැදිරියේ රැඳවියන් 5 ක් 6 ක් පමණ සිටි බවත්, එම අවස්ථාවේදී පැමිණිලිකරුගේ හිසෙන් ලේ ගලමින් තිබූ බැවින් තමා පීඩාවෙන් හා වේදනාවෙන් කෑ ගැසූ බවත්, පසුව නිලධාරින් තමාව කූඩුවෙන් එළියට ගෙන දෙඅත් සහ දෙපා වලට මාංචු දමා කළුතර නාගොඩ රෝහලට පොලිස් ජීප් රථයෙන්ම රැගෙන ගිය බවත් පැමිණිලිකරු විසින් වැඩිදුරටත් සිය පැමිණිල්ල තුළින් දක්වා ඇත.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කළුතර උතුර පොලිස් ස්ථානයේ ස්ථානාධිපති මගින් මෙම පැමිණිල්ලට අදාල උද්ධෘත හා කළුතර මහ රෝහල වෙතින් පැමිණිලිකරුගේ අධිකරණ වෛද්‍ය වාර්තාව කැඳවා ඇත. ඉන් අනතුරුව මෙම පැමිණිල්ලට අදාලව කොමිෂන් සභාව හමුවේ  පරීක්ෂණයක් පැවැත්වීම සඳහා 2022.10.07 වන දින දෙපාර්ශවය කැඳවා තිබුණ ද වගඋත්තරකාර පාර්ශවය ඒ සඳහා සහභාගී වී නොමැති අතර, පැමිණිලිකරු පමණක් එදින සහභාගී වී ඔහුට පොලිස් ස්ථානයේ දී පොලිස් නිලධාරීන් විසින් සිදු කළ පහරදීම් සම්බන්ධයෙන් වැඩිදුරටත් කරුණු දක්වා ඇත.

2022.10.07 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී පැමිණිලිකරු විසින් 2020.09.27 වන දින වස්කඩුව වාඩියවත්ත ක්‍රීඩාංගනයේ පැවති සංගීත සංදර්ශනය නරඹා අළුයම 1.00 ට පමණ පැමිණීමේදී තම රථය කළුතර උතුර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් වාඩියවත්ත ප්‍රදේශයේදී  නතර කර තමා බීමත් බවට චෝදනා කළ බවත්, එම අවස්ථාවේදී තමා බීමත්ව නොසිටි බවත් ප්‍රකාශ කර ඇත. තවද, පොලිස් ස්ථානයේ පඩිපෙළ අසල දී ප්‍රියංකර නැමති පොලිස් නිලධාරියා විසින් තමාගේ බෙල්ල තද වනසේ කොලරයෙන් ඇල්ලීමේදී පැමිණිලිකරු විසින් ද එකී නිලධාරියාගේ ලූමිනස් ජැකට්ටුවෙන් අල්ලා ගත් බවත්, මෙසේ දෙදෙනා පොර බැදීමේදී ඔවුන් දෙදෙනාම වැටුණු බවත් පැමිණිලිකරු විසින් දක්වා ඇත. එහිදී ප්‍රියංකර නැමති පොලිස් නිලධාරියාගේ ඇඟ මතට තමා ඇද වැටුණු හෙයින් තමාට කිසිදු තුවාලයක් සිදු නොවූ බවත්, රාජකාරියේ නිරතව සිටි පොලිස් නිලධාරින් කිහිපදෙනෙකු විසින් ස්වංක්‍රිය ගිනි අවියේ බඳ කොටසින් ද, බැටන් පොලුවලින් ද, අතින් පයින් ද තම හිස සහ බෙල්ලේ පිටුපස යන ස්ථාන වලට පහරදීම් කළ බවත්, ඒ හේතුවෙන් තමාට තුවාල සිදු වූ බවත් .තවදුරටත් සඳහන් කර ඇත.

තවද, 2022.12.01 වන දින දෙපාර්ශවයේ සහභාගීත්වයෙන් නැවත කොමිෂන් සභාව හමුවේ පරීක්ෂණයක් පවත්වන ලදී.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

කළුතර උතුර පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ ස්ථානාධිපති ඩබ්.බී.දයන්ත මහතා විසින් 2022.12.01 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී මෙම පැමිණිල්ලට අදාලව

කරුණු දක්වමින් 2020.09.26 දින වාඩියවත්ත ක්‍රීඩාංගනයේ සංගිත සංදර්ශනයක් පැවැති බවත්, එය 2020.09.27 දින අලුයම 1.30ට පමණ අවසන්ව තිබූ බවත්, එම ස්ථානයේ පො. කො. 77017 ප්‍රියංකර පුෂ්පකුමාර සහ පො. සැ. 55325 පුෂ්පවෙල යන කලුතර උතුර පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කරන නිලධාරින් රාජකාරි සඳහා යොදවා තිබූ බවත් ප්‍රකාශ කර ඇත.

රථ වාහන අංශයේ ස්ථානාධිපති විසින් වැඩිදුරටත් කරුණු දක්වමින් මෙම පැමිණිල්ලට අදාල පැමිණිලිකරු ඔහුගේ කාර් රථයෙන් වාඩියවත්ත ක්‍රීඩාංගනයේ සිට ගාලු කොළඹ ප්‍රධාන මාර්ගයට අතුරු පාරකින් පිවිසීමේදි කොළඹ සිට ගාල්ල දෙසට ගමන් කළ යතුරු පැදියක ඔහුගේ කාර් රථය ගැටි ඇති බවත්, ඒ අවස්ථාවේදි රාජකාරියේ නිරතව සිටි නිලධාරින් විසින් කාර් රථය නවතා පරික්ෂා කර ඇති බවත්, එහිදී රියදුරු අසුනේ සිටි මෙම පැමිණිල්ලට අදාල පැමිණිලිකරු බිමත්ව සිටි බවට පැහැදිලි වි ඇති බවත් සඳහන් කර ඇත.

තවද, මෙම පැමිණිල්ලට අදාල පැමිණිලිකරු වන වින්දිත තැනැත්තාට ඇති වූ තුවාල පිළිබඳව සිදු කළ විමසීමේදි, පැමිණිලිකරු ප්‍රියංකර නැමති නිලධාරියා සමග පොර බැදුණු අවස්ථාවේ දී ඒ අසල තිබූ මල් පොච්චියක ඔලුව හැපිම මත තුවාල ඇති වූ බවත්, ඒ අනුව පොලිස් ස්ථානයට ඉදිරිපත් කිරිමට පෙරාතුව කලුතර මහ රෝහල වෙත පැමිණිලිකරු ඉදිරිපත් කළ බවත් කලුතර උතුර පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ ස්ථානාධිපති ඩබ්.බී.දයන්ත මහතා විසින් විසින් දක්වා ඇත.

එසේම, ඇති වූ තත්ත්වය මත පැමිණිලිකරුගෙන් ප්‍රකාශයක් සටහන් නොකල බවත්, නඩු අංක බී 16243/20 යටතේ බිමත්ව රිය පැදවිම හා සාපරාධි බලහත්කාරයපෑම යන චෝදනා මත පැමිණිලිකරුට එරෙහිව කලුතර මහේස්ත්‍රාත් අධිකරණය වෙත 2020.09.27 දින කරුණු වාර්තා කළ බවත්, පොලිස් නිලධාරින් විසින් මෙම පැමිණිලිකරුට පහර දිමක් සිදු නොකළ බවත් ඔහු විසින් සඳහන් කර ඇත.

වගඋත්තරකරු වන පො. කො. 77017 ප්‍රියංකර මහතා මෙම පැමිණිලිකරු (වින්දිතයා) සමග ඍජුවම සම්බන්ධ වූ බවට කරුණු අනාවරණය වූ හෙයින් ඇති වූ සිද්ධිමය තත්ත්වය සහ පහරදිම් පිලිබඳ වැඩිදුර විමර්ශන ක්‍රියාවලිය සඳහා ඔහුගේ ප්‍රකාශයක් 2022.12.01 වන දින මානව හිමිකම් කොමිෂන් සභාවේ දි ලබා ගන්නා ලදි.

ඔහු විසින් දෙන ලද ප්‍රකාශයට අනුව 2022.09.26 වන දින කලුතර උතුර පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ ස්ථානාධිපති ඩබ්.බී.දයන්ත මහතාගේ නියෝගය අනුව වාඩියවත්ත සැණකෙළි භූමියේ ප්‍රධාන පිවිසුමේ රථ වාහන අංශයේ ස්ථානාධිපති පො. ප. දයන්ත මහතා සහ පො. සැ. 55325 පුෂ්පවෙල මහතා සමග ඔහු රථ වාහන රාජකාරියේ යෙදි සිට ඇත.

ඉහත කී සැණකෙලිය අවසානයේ ජනතාව ප්‍රධාන මාර්ගයට පිවිසෙමින් සිටි බවත්, එම මාර්ගයෙන් පැමිණි මෝටර් රථයක් ප්‍රධාන මාර්ගයට හැරවිමේදි යතුරු පැදියක ගැටීමක් සිදු වූ බවත් වගඋත්තරකරු වන පො. කො. 77017 ප්‍රියංකර මහතා විසින් සඳහන් කර ඇත. තවද, රථ වාහන අංශයේ ස්ථානාධිපති එම ගැටලුව නිරාකරණ කරන අවස්ථාවේ දී මෝටර් රථයේ රියදුරු බීමත්ව සිටි බවට හඳුනා ගත් බවත්, එම නිසා ඔහු රියදුරු අසුනෙන් බස්සවා පිටුපස

අසුනේ හිඳුවා මෝටර් රථය පොලිස් ස්ථානයට ගෙන යන ලෙස රථ වාහන අංශයේ ස්ථානාධිපති විසින් තමා වෙත උපදෙස් දෙන ලද බවත්, එම අවස්ථාවේදී මෝටර් රථයේ ඉදිරි අසුනේ කාන්තාවක්ද, පසුපෙල අසුනේ තවත් පුද්ගලයින් දෙදෙනෙකද සිටි බවත් වගඋත්තරකරු වන පො. කො. 77017 ප්‍රියංකර මහතා විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, පොලිස් ස්ථානයට රැගෙන යන අතරමගදී මෝටර් රථයේ රියදුරු වූ පැමිණිලිකරු විසින් ඔහුව නිදහස් කරන ලෙස ඉල්ලීම් කළ ද, තමා පොලිස් නිලධාරියෙකු ලෙස ඉහළ නිලධාරින්ගේ අණ පිළිපැදිය යුතු බව ඔහුට පැහැදිලි කළ බවත්, එම අවස්ථාවේ ඔහු ඉතා ආවේගශීලිව "තෝ ඉස්කොලේ ගාව කහ ඉරේ දකින බවත් හප්පා මරා මම දවස් 14 ක් ඇතුලට යනවා" යන ආදි වශයෙන් ප්‍රකාශ කළ බවත් වගඋත්තරකරු වන පො. කො. 77017 ප්‍රියංකර මහතා විසින් දක්වා ඇත.

පොලිස් ස්ථානය ඉදිරිපිට මෝටර් රථය නතර කර පැමිණිලිකරුට බහින ලෙස දැන්විමෙන් පසු ඔහු අසභ්‍ය වචන කියමින් තම ලූමිනස් ජැකට්ටුවෙන් තදින් අල්ලා ගත් අවස්ථාවේ එය ඉවත් කිරිමට උත්සහ ගත් නමුත් එය කළ නොහැකි වූ බවත්, පොලිස් ස්ථානයේ පඩිපෙල අසල පොර බැදිමේදී දෙදෙනාම වැටුණු බවත්, එම අවස්ථාවේ දී පැමිණිලිකරුගේ (වින්දිතගේ) ඔලුව පඩිපෙල අසල තිබූ මල් පෝච්චියක ගැටිමෙන් තුවාල වූ බවත්, මෙම අවස්ථාවේ දී පොලිස් ස්ථානයේ සිටි උපසේවක නිලධාරි සහ කාර්ය භාර නිලධාරි එම ස්ථානයට පැමිණ දෙදෙනා වෙන්කර නැගිට වූ බවත් වගඋත්තරකරු වන පො. කො. 77017 ප්‍රියංකර මහතා විසින් පවසා ඇත.

පැමිණිලිකරු චෝදනාගාරයට යෑම හා ප්‍රතිකාර ලබා ගැනිම ප්‍රතික්ෂේප කරමින් පරුෂ වචන කියමින් ඔහුගේ පාදවලින් නිලධාරින්ට පහර දීම් කළ බවත්, ඔහුව පාලනය කිරිම සඳහා දැත් වලට අත් විලංගු දමා සිරමැදිරිය වෙත යොමු කළ බවත්, ඒ සම්බන්ධයෙන් පොලිස් ස්ථානාධිපති වෙත සියලු තොරතුරු ලබා දුන් අතර හැකි ඉක්මණින් පැමිණිලිකරු රෝහල් ගත කිරිමට උපදෙස් ලද බවත්, ඒ අනුව ජංගම සංචාරයේ යොදවා තිබූ නිල රථය ගෙන්වා පැමිණිලිකරු කළුතර මහ රෝහල වෙත ඉදිරිපත් කළ බවත්, වෛද්‍ය නිලධාරි විසින් රෝගියා (පැමිණිලිකරු) පරික්ෂා කර ඔහු මධ්‍යසාර භාවිතා කර ඇති බව සහ ඔහුගේ ශරීරයේ සිරීම් තුවාල ඇති බවට ලකුණු කළ බවත් වගඋත්තරකරු වන පො. කො. 77017 ප්‍රියංකර මහතා විසින් ' වැඩිදුරටත් දක්වා ඇත.

වගඋත්තරකාර පාර්ශවයෙන් ලබා දී ඇති උද්ධෘත වලට අනුව කාර් රථයේ ඉදිරි වම්පස අසුනේ ගමන් ගත් තැනැත්තියගේ ප්‍රකාශ සහ සිද්ධිය ඇසින් දුටු සාක්ෂි ඉදිරිපත් කර ඇත.

ඇස දුටු සාක්ෂියක් ලෙස කාර් රථයේ ගැටුණු බව සඳහන් කරන යතුරු පැදිකරු දෙන ලද ප්‍රකාශය 2020.09.27 පැය 19.25 ට ඡේදය 135 පිටුව 380 යටතේ (Traffic Information Book ) ටි.අයි.බි ලේඛනයේ සටහන්ව ඇත.

## නිරීක්ෂණ සහ නිගමනය

කලුතර උතුර පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ ස්ථානාධිපති ඩබ්.බී.දයන්ත මහතා 2020.09.26 වන දින වස්කඩුව සැණකෙලි භූමිය අසල රථ වාහන පාලන මාර්ග ආරක්ෂක රාජකාරි සඳහා පිටව ගොස් ඇති බව අයි.බී. පිටු අංක 102 හි 363 ඡේදය අනුව පෙනී යයි. එසේම, පො. සැ. 55325 පුෂ්පවෙල සහ පො. කො. 77017 ප්‍රියංකර යන නිලධාරින් ද ඉහත කී රථ වාහන රාජකාරි සඳහා පිටව ගොස් ඇති බව අයි.බී. පිටු අංක 119 හි 179 ඡේදය අනුව දැකගත හැකි වේ.

පැමිණිලිකරු ඔහුගේ ඥාතින් සමග 2020.09.27 වන දින අළුයම 1.00ට පමණ කලුතර වස්කඩුව වාඩියවත්ත ක්‍රීඩාංගනය අසල සිට අංක WP CAX 2241 දරණ මෝටර් රථයෙන් පැමිණෙමින් සිටියදී කොළඹ සිට ගාල්ල දෙසට පැමිණි යතුරු පැදියක ගැටීම හේතුවෙන් ඒ ආසන්නයේ රාජකාරියේ යෙදී සිටි කලුතර උතුර පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ ස්ථානාධිපති විසින් ඔහුගේ මෝටර් රථය නතර කර පරීක්ෂා කර ඇති බව පැමිණිල්ල සහ වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ අනුව නිරීක්ෂණය වේ.

අනතුරුව රථ වාහන අංශයේ ස්ථානාධිපති විසින් මෝටර් රථයේ රියදුරු බීමත්ව සිටි බවට හඳුනා ගත් බැවින් ඔහු රියදුරු අසුනෙන් බස්සවා පිටුපස අසුනේ හිඳුවා මෝටර් රථය පොලිස් ස්ථානයට ගෙන යන ලෙස වගඋත්තරකරු වන පො. කො. 77017 ප්‍රියංකර නිලධාරියා වෙත උපදෙස් දී ඇති බවත්, එම අවස්ථාවේදී මෝටර් රථයේ ඉදිරි අසුනේ කාන්තාවක්ද, පසුපෙළ අසුනේ තවත් පුද්ගලයින් දෙදෙනෙකු ද සිට ඇති බවත්, එම සියලු දෙනා සමග වගඋත්තරකරු වන පො. කො. 77017 ප්‍රියංකර මහතා විසින් මෝටර් රථය කලුතර උතුර පොලිස් ස්ථානය වෙත රැගෙනවිත් ඇති බව පැමිණිලිකරුගේ කරුණු දැක්වීම් සහ පො. කො. 77017 ප්‍රියංකර නිලධාරියා විසින් අයි.බී. පිටු අංක 105 හි 367 ඡේදය යටතේ දක්වා ඇති සටහන අනුව පෙනී යයි.

පොලිස් ස්ථානය ඉදිරිපිට මෝටර් රථය නතර කර පැමිණිලිකරුට බහින ලෙස දැන්වීමෙන් පසු ඔහු අසභ්‍ය වචන කියමින් තම ලුමිනස් ජැකට්ටුවෙන් තදින් අල්ලා ගත් අවස්ථාවේ එය ඉවත් කිරීමට උත්සහ ගත් නමුත් එය කළ නොහැකි වූ බවත්, පොලිස් ස්ථානයේ පඩිපෙළ අසල පොර බැදීමේදී දෙදෙනාම වැටුණු බවත්, එම අවස්ථාවේ දී පැමිණිලිකරුගේ (වින්දිතගේ) ඔලුව පඩිපෙළ අසල තිබූ මල් පෝච්චියක ගැටීමෙන් තුවාල වූ බවත්, මෙම අවස්ථාවේ දී පොලිස් ස්ථානයේ සිටි උපසේවක නිලධාරි සහ කාර්ය භාර නිලධාරි එම ස්ථානයට පැමිණ දෙදෙනා වෙන්කර නැගිට වූ බවත් වගඋත්තරකරු වන පො. කො. 77017 ප්‍රියංකර මහතා විසින් පවසා ඇත.

තවද, වගඋත්තරකාර පාර්ශවය විසින් ඉහත කී ඔවුන්ගේ ප්‍රකාශ තහවුරු කිරීම සඳහා එම අවස්ථාවේදී පොලිස් ස්ථානයට පැමිණ තිබූ පුද්ගලයින් තිදෙනෙකුගේ ප්‍රකාශ ලබා ගෙන කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

ඒ අනුව සිංගප්පුලිගේ වසන්ත ප්‍රනාන්දු, ඉඳුවරගේ නිශාන්ත රෝහණ සිල්වා සහ වීරසිංහගේ දීප්තිකා යන තිදෙනා විසින් අදාළ සිදුවීම සිදුවන අවස්ථාවේදී පොලිස් ස්ථානය වෙත විවිධ කටයුතු සඳහා පැමිණ සිටි බවත්, එහිදී පැමිණිලිකරු විසින් පොලිස් නිලධාරීන් සමග පොර බැදීම හේතුවෙන් පොලිස් ස්ථානයේදී මල් පොච්චියක් මත වැටුණු බවත්, ඉන්පසුව හිසෙන් රුධිරය ගලා යන බව දුටු බවත් ප්‍රකාශ කර ඇත. ඔවුන්ගේ ප්‍රකාශ අනුව පොලිස් නිලධාරීන් විසින් පැමිණිලිකරු වෙත පහරදීමක් සිදු කර නොමැත.

කළුතර මහ රෝහල මගින් ලබා ගත් අංක 2305/20 සහ 2020.09.30 දිනැති පැමිණිලිකරුගේ අධිකරණ වෛද්‍ය වාර්තාවේ කෙටි ඉතිහාසයේ තුළ 2020.09.26 අලුයම 2.00 ට පමණ පැමිණිලිකරු කානිවල් එක බලා පවුලේ අය සමග නැවත එන අවස්ථාවේ ප්‍රියංකර නැමැති පොලිස් නිලධාරියා තම කාර් රථය නවතා තමාට රියදුරු අසුනෙන් බහින ලෙස දැන්වූ බවත්, අනතුරුව ප්‍රියංකර නිලධාරියා අප සියලුදෙනා සමග කාර් රථය පොලිස් ස්ථානයට රැගෙන ආ බවත්, පොලිස් ස්ථානයට පැමිණීමෙන් පසු තමාගේ කොලරයෙන් අල්ලා ගත් නිසා පැමිණිලිකරු ද නිලධාරියාගේ කොලරයෙන් අල්ලා ගත් බවත්, ඉන් අනතුරුව නිලධාරීන් හතර පස්දෙනෙක් පැමිණ තමාට බැටන් පොලු සහ තුවක්කු වලින් පහර දුන් බවත්, පැය භාගයකට පමණ පසු රෝහල් ගත කළ බවත් සඳහන් කර ඇත.

අධිකරණ වෛද්‍ය නිලධාරි එස්.එස්. අත්තනායක මහතා විසින් පැමිණිලිකරු පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වූ තුවාල පිළිබඳව පහත පරිදි දක්වා ඇත..

- හිසෙහි ඉදිරිපස වම්පස ඉහලින් 4 cm ක් දිග වක්‍රාකාරව ඉරිතැලීමක් ඇති අතර එහි අභ්‍යන්තර ඉදිරිපස කෙලවර ඇහිබැමි දක්වා 10 cm ක් ඉහලින් හිස මැද රේඛාවේ තිබූ බව ද,
- හිසෙහි වම්පසට ඉහලින් 5 cm ක් දිග තුවාලයක් ඇති අතර එය වම් කණට 8 cm ක් ඉහලින් ඇති බව ද,
- නළලේ වම්පස 3 x 2 cm ක තැලීම් පහරක් ඇති අතර එය නළලේ මැද සිට 7 cm ක් සහ වම් ඇහිබැමට1 cm ක් ඉහලින් ඇති බව ද,
- බෙල්ලේ මැද රේඛාවේ 1 x 1 cm ක සීරීමක් ඇති අතර, එය බෙල්ලේ පාමුල සිට 3 cm ක් ඉහලින් ඇති බව ද,
- දකුණු අතේ 4 x 3 cm ක තැලීම් පහරක් අති අතර එය වම් වැලමිටට 9 cm ක් ඉහලින් ඇති බව ද,
- ශරීරයේ වෙනත් බාහිර තුවාල, මෘදු පටක ඉදිමුනු ප්‍රදේශ, අස්ථි බිඳීම්, බන්ධන ලකුණු සහ ස්නායු සම්බන්ධ තුවාල නොතිබූ බවද නිරීක්ෂණය කර ඇත.

ඉහත කී තුවාල සියල්ල බරපතළ නොවන මොට ආයුධයකින් සිදු වූ තුවාල වන බවත්, මොට ආයුධයකින් පහර දීමකින් සිරුරේ මෙවැනි තුවාල රටාවක් ඇති විය හැකි බවත්, එකී තුවාල සියල්ල පැමිණිලිකරු විසින් සපයන ලද ඉතිහාසය සමග සැසඳෙන බවත් අධිකරණ වෛද්‍ය එස්.එස්. අත්තනායක මහතා විසින් සඳහන් කර ඇත.

එසේ හෙයින්, වගඋත්තරකාර පාර්ශවයේ ප්‍රකාශයන් සහ ඔවුන් විසින් ඉදිරිපත් කර ඇති ඇසින් දුටු සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශයන් අනුව දක්වා ඇති පරිදි පැමිණිලිකරු හට පොලිස් නිලධාරීන් විසින් කිසිදු පහරදීමක් සිදු නොකළ බවත්, පොර බැදීම හේතුවෙන් පැමිණිලිකරු පොලිස් ස්ථානයේදී මල් පොච්චියක් මත වැටීමෙන් තුවාල සිදු වී ඇති බවත් පිළිගැනීම ගැටලු සහගත බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු අත්අඩංගුවට පත්වන අවස්ථාවේදී ඔහු සමග මෝටර් රථයේ ඉදිරි අසුනේ සිටි ඉෂාරා පියුමිනි විජේසිංහ යන අයගේ ප්‍රකාශය අනුව පැමිණිලිකරු අත්අඩංගුවට පත්වන අවස්ථාවේ බියර් බෝතලයක් පානය කර සිටි බවත්, පොලිස් නිලධාරීන් හට බැන වැදීම් සිදු කළ බවත්, පොලිස් ස්ථානයේ කාර් රථය නතර කර පැමිණිලිකරු බැස පොලිස් ස්ථානයට යන අවස්ථාවේ පොලිස් නිලධාරියාගේ බෙල්ලෙන් අල්ලනවාත් සමගම පොලිස් නිලධාරියාද ක්ෂණිකව පැමිණිලිකරු සමග පොර බැදීමක් සිදු වූ බවත්, දෙදෙනාම බිම වැටුණු අවස්ථාවේ පොලිස් ස්ථානය තුළ සිටි නිලධාරීන් කිහිපදෙනෙකු පැමිණ පහර දෙන්නට වූ බවත්, මෙම අවස්ථාවේදී බේරා ගැනීමට උත්සහ ගත් නමුදු නොහැකි වූ බවත් සදහන් කර ඇත.

එකී ප්‍රකාශය සහ අංක 187 සහ 2020.09.27 දිනැති අධිකරණ වෛද්‍ය පෝරමයේ අංක 16 යටතේ පැමිණිලිකරු මධ්‍යසාර භාවිත කර ඇති බවට සදහන් කර ඇති බැවින් අත්අඩංගුවට පත්වන අවස්ථාවේ පැමිණිලිකරු බීමත්ව සිට ඇති බව තහවුරු වන බව කොමිෂන් සභාවට පෙනී යයි.

පැමිණිලිකරු සහ වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කර ඇති කරුණු අනුව සලකා බැලීමේදී පැමිණිලිකරු සහ වගඋත්තරකරු වන ප්‍රියංකර නම් පොලිස් නිලධාරියා අතර පොර බැදීමක් සිදු වී ඇති බව සහ පැමිණිලිකරු පොලිස් ස්ථානයේදී ඇදවැටී ඇති බව පිළිගත හැකි නමුත්, පැමිණිලිකරුගේ ශරීරයේ තිබූ තුවාල එලෙස ඇද වැටීමෙන් සිදු වී ඇති බව අධිකරණ වෛද්‍ය වාර්තාවේ සදහන් කරුණු අනුව සලකා බැලීමේදී පිළිගැනීම ගැටලු සහගත බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

වගඋත්තරකරු වන පො. කො. 77017 ප්‍රියංකර නිලධාරියා සහ 2020.09.27 දින කළුතර උතුර පොලිස් ස්ථානයේ රාජකාරියේ නිරතව සිටි නිලධාරීන් කිහිපදෙනෙකු විසින්ද පැමිණිලිකරුට පහර දීම් සිදු වී ඇති බවට නිරීක්ෂණය වේ. එහෙත් ප්‍රියංකර නිලධාරි හැරුණු කොට අනෙකුත් නිලධාරි හරිහැටි නම් කිරීමක් හෝ හදුනා ගැනීමක් අනාවරණය නොවේ.

වාඩියවත්ත සැණකෙළි භූමියේ රාජකාරියේ රැදී සිටි වගඋත්තරකරු වන පො. කො. 77017 ප්‍රියංකර නිලධාරි සමග පැමිණිලිකරු සහ ඔහුගේ පිරිස පොලිස් ස්ථානයට පැමිණි බවට කරුණු පැහැදිලි වී ඇත. පැමිණිලිකාර පාර්ශවයේ කිහිපදෙනෙකු මෙම අවස්ථාවේ සිටියද ඔවුන්ගේ සාක්ෂි කොමිෂන් සභාව වෙත ලබා දීමට පැමිණිලිකාර පාර්ශවය අපොහොසත් වී ඇත.

<u>අමල් සුදත් සිල්වා</u> එ. <u>පො.ප. කොඩිතුවක්කු</u> (1987) 2 Sri L.R. 119 නඩුවේ දී ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව ප්‍රකාරව කිසිම තැනැත්තෙකු වධහිංසා වලට හෝ කෲර

අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඩුවමකට යටත් නොකළ යුතු බවත්, එය කිසිදු සීමාවකට යටත් කර නොමැති මූලික අයිතිවාසිකමක් බවත්, යම් පුද්ගලයෙකු අපරාධකරුවෙකු වුවද මෙම මූලික අයිතිවාසිකම ඔහුට ද එලෙසින්ම අදාළ වන බවත් සඳහන් කර ඇත.

ඒ අනුව මෙම පැමිණිල්ලට අදාළ පැමිණිලිකරුව වගඋත්තරකරු ඇතුළු කලුතර උතුර පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරීන් විසින් වධහිංසාවලට ලක් කර ඇති බව ඉහතින් දක්වා ඇති පරිදි අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව ද තහවුරු වන බැවින්, පැමිණිලිකරු පොලිස් අත්අඩංගුවේ සිටියදී කෲර අමානුෂික වධහිංසාවලට ලක් කිරීමෙන් වගඋත්තරකරු විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කර සිටී.**

1. වගඋත්තරකාර පාර්ශවය විසින් රුපියල් හත්දහස් පන්සියය (රු.7,500/-)ක මුදලක් පැමිණිලිකාර පාර්ශවය වෙත ගෙවිය යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2. මෙම සිදුවීමේදී වගඋත්තරකාර පාර්ශවය විසින් ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව විනය පරීක්ෂණයක් පවත්වා ඒ සම්බන්ධයෙන් විනය පියවර ගැනීමට පොලිස්පතිවරයා වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2024.10 . 22 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 (7)වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්. ටී. බී. දෙහිදෙණිය
සභාපති,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත්: 01. අමාත්‍යතුමා, - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති, - අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා
ශ්‍රී ලංකා පොලීසිය